ලිඛිත නියෝජනයන් - (S.L.Au.S. – 580)

- ❖ **හැඳින්වීම**
- ❖ **ලිඛිත නියෝජනයක් යනු කුමක්ද?**
- ❖ **ලිඛිත නියෝජනයක් ලබාගත් පසු අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටි**

හැඳින්වීම

මූල්‍ය වාර්තා වල අදාළව යම් යම් ප්‍රමාණාත්මක කරුණු පිළිබඳව ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ප්‍රමාණයක් විගණකට විගණන ක්‍රියාපටිපාටි මගින් අපේක්ෂා කළ නොහැකි විට විගණකට ව්‍යාපාරය තුළින් (කළමනාකරණය හරහා) ලිඛිත නියෝජනයන් ලබා ගැනීමට සිදුවනු ඇත. මෙසේ ලබාගන්නා සෑම නියෝජනයක්ම ලිඛිතව ලබාගැනීම විගණක විසින් සිදුකළ යුතු වේ. මක් නිසාද යත් ලිඛිතව ලබාගන්නා වූ විගණන සාක්ෂියක් තුළ වාචික සාක්ෂියකට වඩා ඉහළ විශ්වාසනීයත්වයක් ඇති බැවිනි. මෙම නිසා ප්‍රායෝගිකව විගණනයන් සිදු කිරීමේදී තම විගණන ක්‍රියාපටිපාටි මගින් විගණන සාක්ෂි ලබා ගැනීමට අපහසු අවස්ථාවකදී විගණකට කළමනාකාරීත්වය තුළින් ලිඛිත නියෝජනයන් ලබාගැනීමට සිදුවනු ඇත.

1) ප්‍රවර්තන වර්ෂය තුළ ව්‍යාපාරයෙන් තෙවන පාර්ශවයකට, නොසේනම් තෙවන පාර්ශවයකගෙන් ව්‍යාපාරයට නඩු කටයුත්තක් ගොනු කර ඇත්නම් එම වත්මන් තත්ත්වය විගණකට දැන ගැනීමට අවශ්‍ය වේ නම් ව්‍යාපාරයේ කළමනාකාරීත්වයෙන් / නීතිඥයින්ගෙන් ඒ පිළිබඳව විමසීම් කර ලිඛිත නියෝජනයක් ලබාගැනීමට සිදුවේ.

2) ව්‍යාපාරය දිගින් දිගටම මෙහෙයුම් අලාභ ලබන තත්ත්වයක් තුළදී එය ව්‍යාපාරයේ අඛණ්ඩ පැවැත්ම සඳහා තර්ජනයක් එල්ල වන බැවින් ව්‍යාපාරයේ ඉදිරි අනාගත සැලසුම් පිළිබඳව විගණකට දැනගැනීමට අවශ්‍ය වේ නම් කළමනාකාරීත්වයෙන් එම සැලසුම් ඇතුලත් කර නියෝජනයක් ලබා ගත හැක.

ලිඛිත නියෝජනයක් යනු කුමක්ද?

"කිසියම් ගැටලුවක් සම්බන්ධයෙන් තහවුරු කිරීමට / අනෙකුත් විගණන සාක්ෂියක් සඳහා ආධාරකයක් ලෙස කළමනාකාරීත්වය විසින් හෝ පාලනය සම්බන්ධයෙන් වගකීම දරන පාර්ශවයන් විසින් විගණකට ලබාදෙන්නා වූ ලිඛිත ප්‍රකාශයන් ලිඛිත නියෝජනයක් ලෙස හඳුන්වයි." මෙහිදී ලිඛිත නියෝජනයන්,

ව්‍යාපාරයේ කළමනාකාරීත්වය විසින්ම විගණකට ලබාදීම සහ විගණකගේ ප්‍රශ්න කිරීම් වලට ප්‍රතිචාරයන් ලෙස ලබාදිය හැක.

ඉතා වැදගත්

විගණකවරයෙකුට ප්‍රායෝගිකව විගණන ක්‍රියාපටිපාටීන් ක්‍රියාත්මක කර ප්‍රමාණවත් සහ යෝග්‍ය සාක්ෂි ලබාගත හැකි අවස්ථාවකදී එයට විකල්පයක් / ආදේශකයක් ලෙස කළමනාකරණයෙන්ම ලිඛිත නියෝජනයක් ලබාගත නොහැක.

උදා: විගණකවරයෙකු සිදුකරන ලද ශේෂ විමසීමක් සඳහා ණයගැතියෙකු ප්‍රතිචාරය ලබානොදුන් අවස්ථාවකදී ඒ සඳහා පහත සඳහන් විකල්ප ක්‍රියාපටිපාටි අනුගමනය කළ හැක.

(i) එම ණයගැතියන්ට අදාළ ණයට විකුණුම් ඉන්වොයිස් පරීක්ෂා කිරීම.
(ii) එම ණයගැතියන්ට අදාළව ශේෂ පත්‍ර දිනෙන් පසු මුදල් පොතේ ලැබීම් තීරුව පරීක්ෂා කිරීම.

ඉහත ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක නොකර එම ණයගැතියාගේ ශේෂයට අදාළව ලිඛිත නියෝජනයක් ලබාගත නොහැක.

විගණක කළමනාකාරීත්වයෙන් ලිඛිත නියෝජනයක් ලබාගත් පසු අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටි

(i) අදාළ නියෝජනය ලබාදුන් පාර්ශවය අදාළ කරුණ පිළිබඳව අවබෝධයක් ඇති පාර්ශවයක් ද යන්න.

(ii) ලබාගත් ලිඛිත නියෝජනය, ලබාගත් අනිකුත් විගණන සාක්ෂි සමග එකඟවේද? නොවේද? යන්න.

....

....

....

....

....

....

....

....

....

....

....

....

ඉතා වැදගත්

(01) කළමනාකරණය ලබාදුන් ලිඛිත නියෝජනයන්, ලබාගත් වෙනත් විගණන සාක්ෂියක් සමග ගැටෙන විට, එම නියෝජනය හා ලබාදුන් අනිකුත් නියෝජනයන් පිළිබඳව විගණක විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(02) කළමනාකාරීත්වය ලිඛිත නියෝජනයක් ලබාදීම ප්‍රතික්ෂේප කිරීම විගණකගේ විෂයපථය සීමා කිරීමක් වේ. එය මූල්‍ය වාර්තා හා විගණනයට ඇතිකරන බලපෑම විගණක සළකා බැලිය යුතු වේ.

අතිරේක සටහන්

....

....

....

....

....

....

....

....

....

....

....

JMC vLearning "your virtual learning partner"